# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජුනි

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ මනෝවිද්‍යාව

**බෞද්ධ මනෝවිද්‍යාවේ මූලාශ්‍රය අධ්‍යයනය හා බෞද්ධ මනෝ - කායික විශ්ලේෂණයෙහි මූලිකාංග BUPS – 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. මිනිස් හැසිරීම්වල ස්වභාවය කෙරෙහි කර්මය බලපෑ අයුරු නිබ්බේධික සූත්‍රය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. ක්ෂණාත්මක මානසික ආවේග වශයෙන් ප්‍රපංචකරණයේ ස්වභාවය මූලාශ්‍රය ඇසුරෙන් පහදන්න.

03. පුද්ගල හැසිරීම් සහ මානසික සංවර්ධනය අතර පවතින සබඳතාවය මිගසලා සූත්‍රය ඔස්සේ අධ්‍යයනය කරන්න.

04. මානව චර්යාවන් නිවැරදි කිරීම සඳහා උපයෝගී කරගත හැකි බෞද්ධ මනෝචිකිත්සක ක්‍රමවේදයන් පිළිබඳ සූත්‍රාගත තොරතුරු පරීක්ෂා කරන්න.

05. අභිචාරවිධීන්හි පවතින මනෝචිකිත්සාමය වටිනාකම බෞද්ධ මූලාශ්‍රයාගත තොරතුරු ඔස්සේ විමසන්න.

06. නිවැරදි දැක්ම (සම්මා දිට්ඨි) ලඟාකර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස බෞද්ධ විශ්ලේෂණ හා සංශ්ලේෂණ ක්‍රමයන්හි උපයෝගිතාව පෙන්වා දෙන්න.

07. ඉන්ද්‍රිය සංජානන හා විජානන ලෝකය පිළිබඳ බෞද්ධ ආකල්පය ප්‍රකට කරන්න.

08. පුද්ගල පෞරුෂත්වයේ සංවේදන හා සංජානන ක්‍රියාවන් පඤ්චස්කන්ධ සංකල්පය ඇසුරෙන් විවරණය කරන්න.

09. මානසික සංඝටක පිළිබඳ බෞද්ධ විග්‍රහය චෛතසික සංකල්පය ඇසුරෙන් සනිදර්ශනව විශද කරන්න.

10. මානසික රෝග හා අකුසල චෛතසික පිළිබඳ තුලනාත්මක විග්‍රහයක යෙදෙන්න.

************************************